# සංකල්ප පත්‍රය

## දේශගුණ විපර්යාසයනට ඔරොත්තු දීමේ හැකියාව සඳහා **දේශගුණ විපර්යාසයන්ට අනුහුරු වීම සඳහා වන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය හෙවත් වැව්ගම් පුබුදුව ව්‍යාපෘතියෙහි** දායකත්වය හා උගත් පාඩම් පිළිබඳ සම්මන්ත්‍රණය

# Symposium on Climate Action 2025

## හැඳින්වීම

දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය හෙවත් වැව්ගම් පුබුදුව ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ට, ඒනම් විශේෂයෙන් කාන්තාවන්ගේ, දේශගුණ විචල්‍යතාවයන්ට සහ එහි ආන්තික සිදුවීම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමයි.

හරිත දේශගුණික අරමුදලේ (GCF) මූල්‍ය දායකත්වයෙන් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) තාක්ෂණික සහයෙන් වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ මල්වතු ඔය, යාන් ඔය සහ මී ඔය යන ගංගා ද්‍රෝණි තුනේ වැඩි දියුණු කළ ජල කළමනාකරණය තුළින් ආහාර, ජීවනෝපාය සහ ජල සුරක්ෂිතතාව ඉහළ මට්ටමකට ළඟා කර ගැනීම කෙරෙහි මෙම මැදිහත්වීම් වල අවධානය යොමු කරන ලදී. ඒකාබද්ධ ප්‍රවේශයක් සඳහා අනුගමනය කරන ලද අවකාශීය ඒකකය වූයේ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරයේ සුවිශේෂී ලක්ෂණයක් වූද ලෝක කෘෂිකාර්මික උරුමක් වූද වැව් ඒල්ලංගා පද්ධති විය.

මෙම ව්‍යාපිතිය 2017 දී ආරම්භ කරන ලද අතර 2025 දී අවසන් කිරීමට සැලසුම් කර ඇත. ජල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් දේශගුණික විචල්‍යයතා සහ ආන්තික සිදුවීම් සඳහා වියළි කලාපයේ කුඩා ගොවීන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම මෙහි අරමුණයි. මෙම ව්‍යාපෘතිය මී ඔය, මල්වතු ඔය සහ යාන් ඔය ගංගා ද්‍රෝණි තුනේ ජීවත් වන 780,200 කට ප්‍රජාවය සෘජුවම ප්‍රතිලාභ ලබා දෙන අතරම වාරිමාර්ග, පානීය ජලය සහ ආපදා අවදානම් කළමනාකරණය සඳහා වන ආයෝජන හරහා සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා ධාරිතා වර්ධනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වල මැදිහත්වීම් වැනි ක්‍රියාකාරකම් ඔස්සේ තවත් 1,158,000 ක ප්‍රජාවට ප්‍රතිලාභ ලැබේ.

මෙම ව්‍යාපෘතිය තුළින් සම්ප්‍රදායික ජල හා පාරිසරික සම්පත් කළමනාකරණ ක්‍රමවේද හා නවම්‍ය තාක්ෂණ ක්‍රමවේද භාවිතා කර වඩා තිරසර ඒල්ලංගා පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමට සමත් වී ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රකරගත් මැදිහත්වීමක් තුළින් කාන්තාවන් ඉලක්ක කර ගැනීම සහ තීරණ ගැනීමේ මට්ටමින් දේශීය සම්පත් කළමනාකරණය සඳහා කාන්තාවන් සහ තරුණ තරුණියන්ගේ අන්තර්ග්‍රහණය වැඩි දියුණු කිරීම කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කෙරිණි.

## ජාත්‍යාන්තර සම්මන්ත්‍රණයක් සඳහා වන තාර්කිකත්වය

එවකට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2016 වසරේ දී ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවේ සඳහන් වූයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් දැනුම කළමනාකරණය කිරීම හා අනාගත සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී, ගංගා ද්‍රොණි කළමනාකරණ සැලසුම් කිරීමේදී සහ විශේෂයෙන් තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී ප්‍රයෝජනවත් වනු ඇති බවයි. උගත් පාඩම් ප්‍රමාණවත් ලෙස සටහන් කර අනාගත භාවිතය සහ ප්‍රති නිෂ්පාදනය සඳහා ලේඛනගත කළ යුතු බව යෝජනාව නිර්දේශ කළේය. ඒමෙන්ම මේ හා සමාන ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි උගත් පාඩම් හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා ගැනීම සහ මෙම පාඩම් පුළුල් ලෙස ව්‍යාප්ත කරනු ඇත. මෙම ව්‍යාපෘතිය එකම

රටක, කලාපයේ සහ ගෝලීය වශයෙන් සමාන අවධානයක් යොමු කරන වෙනත් ව්‍යාපෘති අතර අඛණ්ඩ තොරතුරු හුවමාරුවක් සිදු කරනු ඇත.

මෙම ව්‍යාපෘතිය පිළිබඳ ස්වාධීන අතුරු ඇගයීමක් (IIE) 2021 දී සිදු කරන ලදී. මෙම IIE හි ප්‍රධාන නිරීක්ෂණ වලට ඇතුළත් වූයේ:

1. ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය (කෘෂිකාර්මික ජල භාවිතය, පානීය ජල සැපයුම්, කෘෂි කාලගුණ විද්‍යාව ) සඳහා ව්‍යාපෘතියේ ප්‍රවේශය රටට නවෝත්පාදන ගෙනෙන අතර අනාගත අන්තර් ආංශික ප්‍රවේශයන් සඳහා ආදර්ශ සපයන බවයි.
2. ව්‍යාපෘතියෙන් පසුව ඒහි වූ භාවිතයන්ගේ තිරසාරභාවයේ සම්භාවිතාව වැඩි දියුණු කිරීම සඳහා, අන්තර් ආංශික ගංගා ද්‍රෝණි ප්‍රවේශයේ ප්‍රතිලාභ, භාවිතා කරනු ලබන නවෝත්පාදන , තාක්ෂණය සහ ව්‍යාපෘති උගත් පාඩම් ප්‍රධාන ධාරාවට ගෙන ඒම පිළිබඳ වැඩි දැනුවත් භාවයක් තිබෙන බව යන්නයි.

2024 අවසානය වන විට, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල හත්වන වසරට පිවිසෙනු අතර, එම කාලය වන විට **ව්‍යාපෘතිය** බොහෝ භෞතික ඉලක්ක කරා ළඟා වී තිබුණි. එබැවින්, ව්‍යාපෘති යෝජනාව, ව්‍යාපෘති ලේඛනය සහ IIE වාර්තාවේ නිර්දේශ සැලකිල්ලට ගනිමින්, උගත් පාඩම් බෙදා ගැනීමේ සම්මන්ත්‍රණයක් (Symposium on Climate Action 2025) පැවැත්වීමට සැලසුම් කර ඇත.

## යෝජිත සම්මන්ත්‍රණය

මෙම සම්මන්ත්‍රණය 2025 **සැප්තැම්බර් 30 සහ ඔක්තෝම්බර් 01 වන දින** දෙදින තුළ පැවැත්වේ. ව්‍යාපෘති කාර්ය මණ්ඩලය, පාර්ශවකරුවන්ගේ ආයතන සහ විද්වතුන් විසින් දායක වන මෙය දින දෙකක සම්මන්ත්‍රණය වේ. වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති CRIWMP හෙවත් වැව්ගම් පුබුදුව ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකය UNDP හා ඒක්ව මෙය සංවිධානය කරනු ලබන අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලය ශාස්ත්‍රීය සහකරු (Academic partner) ලෙස තම දායකත්වය ලබා දෙයි.

මෙම සම්මන්ත්‍රණය මගින් කෘෂිකර්මාන්තය සඳහා ජලය , පානීය ජලය, කාලගුණ විද්‍යාව , ආපදා කළමනාකරණය සහ පරිසරය හා සම්බන්ධව කටයුතු කරන හා ඒ ආශ්‍රිත වෘත්තිකයන් හා පාර්ශවකරුවන් එක් කර ගනු ලැබේ. ප්‍රජාව සඳහා විසින් දේශීය සම්පත් ඒකාබද්ධව කළමනාකරණය කිරීම , ගංගා ද්‍රෝණි කළමනාකරණයේ සුසමාදර්ශීය වෙනස්කම් වලට තුඩු දිය හැකි ආකාරය පිළිබඳ නව අවබෝධයක් ලබා දෙයි. එය අවදානමට ලක්විය හැකි ප්‍රජාවගේ දේශගුණික ඔරොත්තු දීමේ හා අනුහුරුවීමේ හැකියාව වර්ධනය කරන අතර අදාළ අංශවල ප්‍රතිත්ති සම්පාදනය සඳහා සක්‍රිය කිරීමට බලපානු ඇත. මෙම සම්මන්ත්‍රණයයේ ප්‍රධාන කාර්යන් ලෙස දේශන, පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්, පෝස්ටර් සැසි හා ක්‍ෂත්‍ර අධ්‍යානය චාරිකා ඇතුළ වේ. ප්‍රධාන වශයෙන් වැව්ගම් පුබුදුව ව්‍යාපෘතියෙන් උගත් පාඩම් සහ ඒ හා සමාන ස්වභාවයේ ඇති වෙනත් ව්‍යායාපෘති කෙරෙහි අවධානය යොමු කරයි. මීට අමතරව, සංවර්ධන නියෝජිතායතන, හවුල්කරුවන් සහ ශාස්ත්‍රඥයින් සම්බන්ධ තෝරාගත් මාතෘකා පිළිබඳව සමාන්තරව විද්වත් සංවාද මණ්ඩප පවත්වනු ඇත.

### තේමාවන් සහ මාතෘකා

මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන තේමාව වන්නේ " ඒකාබද්ධ ජල කළමනාකරණ පිළිබද උගත් පාඩම් තුළින් ආහාර, ජලය සහ දේශගුණික සුරක්ෂිතතාව" යන්නයි.

ප්‍රධාන මාතෘකා වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- දේශීය මට්ටමින් දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීම; උගත් අභියෝග සහ පාඩම්
- දේශගුණ ස්මාර්ට් කෘෂිකර්මාන්තය: අවස්ථා සහ අභියෝග
- දේශගුණ විපර්යාසවලට අනුවර්තනය සඳහා පානීය ජල කළමනාකරණ විසඳුම්
- දේශගුණික උපදේශන සහ පූර්ව අනතුරු ඇඟවීම්: මෑත කාලීන නවෝත්පාදනයන්, සාර්ථකත්වයන් සහ ප්‍රදේශීය මට්ටමින් අනුගමනය කිරීමට ඇති සීමාවන්
- ග්‍රාමීය වාරි මාර්ග පද්ධති පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම
- ඒල්ලංගා මට්ටමින් ජලය හා ඒ ආශ්‍රිත සම්පත් ඒකාබද්ධ කළමනාකරණය
- ප්‍රතිපත්තිමය , මූල්‍ය , ආයතනික සහ නීතිමය ගැටළු; අවස්ථා සහ සීමාවන්



Organizers
MINISTRY OF AGRICULTURE, LIVESTOCK, LANDS AND IRRIGATION
වැව් ගම් පුබුදුව
CLIMATE ACTION CENTRE
Academic Partner
Funding Partner
GREEN CLIMATE FUND
Technical Partner
UNDP
Janathakshan
Contributing Partners
SRI LANKA RED CROSS SOCIETY
SAPSRI
PARTICIPATORY ACTION LEARNING METHODOLOGIES
MAHAWELI CONSULTANCY BUREAU